# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත /කාර්යාලගත බන්ඩ 02 සේවා ගණය (බදු නිලධාරී) II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය -2021

සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත /කාර්යාලගත බනඩ 02 සේවා ගණය (බදු නිලධාරී II ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් සබරගමුව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. 2021 මාර්තු මාසයේදී පමණ විභාගය පැවැත්වීමට අපේක්ෂිතය.

01. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව :- 04
(දිස්ත්‍රික් ජන අනුපාතය අනුව කෑගල්ල - 02 හා රත්නපුර -02)

02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :- 2021.01.15

03. බඳවා ගැනීමේ සුදුසුකම් :-
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඕනෑම උපාධියක් හෝ නීතිඥවරයකු වීම.

04. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු.21 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

05. මෙම තනතුරට අදාල වැටුප් පරිමාණය :-
අංක 3/2016 හා 2016.02.25 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 02 සේවා ගණය (බදු නිලධාරී) II ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN-05-2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු.34,605-10x660-11x755-15x930 -රු. 63460/= වේ මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද හිමි වේ.

06. විවෘත තරඟ විභාගයේ ඉහළම කුසලතාවය ලබා ගන්නා අයදුම්කරුවන් සඳහා පමණක් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත්වීම් ලබා දීම සිදු කෙරේ.

07. මෙම බඳවා ගැනීම සම්පූර්ණ නිවේදනය සහ ආදර්ශ අයදුම්පත්‍රය www.sg.gov.lk හා www.psc.sg.gov.lk වෙබ් අඩවිවල පළකර ඇත.

පී.එස්.ආර්.එම්. විජයරාජ
ලේකම්
පළාත් රාජ් සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත

2020.12.09